# ක්ෂේත්‍ර පුරාවිද්‍යා කටයුතුවලදී ආචාරධර්ම වැදගත්වන ආකාරය

ඩබ්. මධුභාෂිණී චන්ද්‍රපාල[1], ආර්.එම් භාග්‍යා සමෘර්ධි ද සිල්වා[2], ඩබ්.ඒ අමිත් ප්‍රියංකර ප්‍රේමතිලක[3]

පුරාවිද්‍යාව විෂයක් ලෙස වර්ධනය වීම සඳහා ද ආචාරධර්ම පද්ධතිය හේතු වන අතර ප්‍රායෝගික විෂයක් වූ පුරාවිද්‍යාවේ පැවැත්ම මෙකී ආචාරධර්ම මත රඳා පවතියි. ආචාරධර්ම ඒ ඒ සමාජවල හා විෂය ක්ෂේත්‍රවලට ආවේණික පරිදි ස්වාධීනව ගොඩනගා ගන්නා එම සමාජයේ හෝ එම විෂය ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා සෘජුව හේතුවන බව හඳුනාගත හැකිය. ප්‍රායෝගික විෂයක් වූ පුරාවිද්‍යා විෂය ෂේත්‍රයෙහි වර්ධනය හා පැවැත්ම සඳහා ද ආචාරධර්ම හේතුවන බව සඳහන් කළ යුතුය. ඒ අනුව භෞතික සංස්කෘතිය අධ්‍යයනය කරන පුරාවිද්‍යාඥයා එම කටයුතු යහපත් පරිදි සිදු කිරීම සඳහා පුරාවිද්‍යාවේ පවතින ආචාරධර්ම හඳුනාගත යුතුය. එම ආචාරධර්ම අතරට අවංකභාවය, අගතිගාමී නොවීම, ඉවසීම, අන්‍යමත ගරු කිරීම යනාදිය ඇතුලත් වන බව පෙන්වාදිය හැකිය. පුරාවිද්‍යාඥයාට සිවිල් නීතිය හා පුරාවිද්‍යා නීතියට අනුගතව කටයුතු කිරීමට සිදු වෙයි. විශේෂයෙන්ම මෙහිදී ජාතික හා ජාත්‍යන්තරව සම්මත වූ නීති රීතිවලට එකඟ වීම හා ඒවා ඉදිරියට පවත්වාගෙන යාමට ක්‍රියා කිරීම පුරාවිද්‍යාඥයාගේ යුතුකමකි. එමෙන්ම ක්ෂේත්‍ර කටයුතුවලදී තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ න්‍යායාත්මක කරුණුවලට අනුව ක්‍රියා කිරීම ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු අවසරයකින් තොරව ලබානොදීම සහ ව්‍යාපෘතිභාර නිලධාරියාගේ අවසරයකින් තොරව ක්ෂේත්‍ර උපකරණ හා වාර්තා සමාජගත නොකිරීමට පුරාවිද්‍යාඥයා කටයුතු කළ යුතුය. එමෙන්ම ක්ෂේත්‍ර පුරාවිද්‍යා කටයුතුවලදී අවංකභාවය ද අතිශයින් ප්‍රගුණ කළ යුතු ආචාරධර්මයකි. එහිදී තමා සතු ආත්ම අවංකභාවය ඉතාම වැදගත්ය. එයට ප්‍රධානතම හේතුව ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයා හැම විටම මූල්‍යමය වටිනාකමින් යුක්ත මානවකෘති සමග අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි. එවැනි අවස්ථාවකදී තම ආත්ම අවංකභාවයට එරෙහිව කටයුතු කරන්නේ නම් කැණීම් ආශ්‍රිත පුරාවස්තු සොරකම් කිරීම, පුරාවස්තු විදේශගත කිරීම යනාදිය සිදුවිය හැකිය. එසේම සිය අර්ථකථන ගොඩනැංවීමේ දී වැරදි තොරතුරු අවංක භාවයකින් තොරව ප්‍රකාශයට පිතකිරීමට ද වග බලාගත යුතුය. මෙසේ සලකා බලන විට තමාගෙන් සිදුවන වැරදි අවම කරගැනීම සඳහා ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයාට ආචාරධර්ම මැනවින් උපකාරී වෙයි. ක්ෂේත්‍ර කටයුතුවලදී අන් අය සමග ඉතා සුහදසීලීව කටයුතු කිරීමට ද සිදු වෙයි. අන්‍ය මතවලට සවන් දීම, සේවකයන්ගේ අදහස් ගරු කිරීම ආදියට විශේෂයෙන් මෙහිදී කාරුණික විය යුතුය. සෙසු පිරිස වෘත්තීමය අතින් පහත් නොකිරීම ද වැදගත් ගුණධර්මයකි. පුරාවිද්‍යා කටයුතු සාමූහික ක්‍රියාවලියක එකතුවකි. එම සාමූහික වගකීමක් වන අතර පර්යේෂණ අරමුණ සාර්ථක කරගැනීමට ද ආචාරධර්ම වැදගත් වන බව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : ආචාරධර්ම, ආයතනික වැදගත්කම, සාමාජීය වැදගත්කම, අභියෝග

[1] භාෂා අධ්‍යයනාංශය, CINEC කැම්පස්. Chandrapalamadhubhashini@gmail.com